# බිත්තර වී නිපැයීම හා බෙදා හැරීම

ඵලදාව වැඩිකර ගැනිමේදී ඉවහල් වන එක් මූලික අවශ්‍යතාවයක් වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරනලද උසස් වර්ගයේ වී පුළුල් වශයෙන් යොදා ගැනීමයි. පහත දක්වෙන අනුපිළිවෙල සහිත එම අවශ්‍යතාවය සපුරාලීමේ වගකීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වේ.

(අ) පර්යේෂණ අංශය මගින් දියුණු කළ වී වර්ග වර්ධනය කිරීම හා බිත්තර වී නිෂ්පාදනය හෝ බිත්තර වී ප්‍රගුණ කිරීමේ ක්‍රියාදමයට අභිජනනය කරන්නාගේ බීජ සැපයීම.

(ආ) තත්ත්ව පාලන හා බීජ සහතික කිරීමේ කොන්දේසි වලට යටත් ඉපදවීමේ පද්ධතියක් මත අභිජනනය කරන්නාගේ බීජ වලින් පටන් ගෙන සහතික කරන ලද බීජ දක්වා ගොවියාගේ ප්‍රයෝජනය තකා ප්‍රමාණයෙන් තරම් උසස් වර්ගයේ බිත්තර වී නිෂ්පාදනය කිරීම.

මෙය ගොවිපල් හා රෝපන ද්‍රව්‍ය අංශයේ වගකීම වේ. පහත දක්වෙන බීජ ප්‍රජනනයන් හෝ පංති පද්ධතිය මගින් පිළිගැනේ.

**අභිජනනය කරන්නාගේ බීජ.**—රෝපණ අභිජනනය කරන්නන් මගින් උපදවා සපයනු ලබන පවිත්‍ර බීජ විශේෂයකි.

**අත්තිවාරම් බීජ.**— (දෙවන ප්‍රජනනය)— පර්යේෂණ අංශයේ පරික්ෂාව යටතේ අභිජනනය බීජ වගා කිරීමෙන් ලබා ගනී. මෙම බීජය පිරිසැකසුම් කර සහතික කරන ලද්දකි.

**ලියාපදිංචි කල බීජ.**— (තුන්වන ප්‍රජනනය) — අත්තිවාරම් බීජයෙන් පැවතෙන්නකි. රජයේ ගොවිපල්වල්, ගොවිපල් හා රෝපණ ද්‍රව්‍ය අංශයේ කාර්‍ය්‍ය මණ්ඩලයේ පරික්ෂාකාරීත්වය යටතේ වගා කෙරේ. මෙම බීජය පිරිසැකසුම් කර සහතික කරන ලද්දකි.

**සහතික කළ බීජ.**—(සිව්වන ප්‍රජනනය)— තෝරාගත් ගොවීන්ගේ (කොන්ත්‍රාත් ක්‍රමයට කළ) කුඹුරු වල ලියාපදිංචි කළ බීජ වගාකිරීමෙන් සපයා ගෙන ඉන් අනතුරුව ගොවිපල් හා රෝපණ ද්‍රව්‍ය අංශය මගින් යන්ත්‍රානුසාරයෙන් පිරිසැකසුම් කර සහතික කොට කෘෂිකර්ම උපදේශක වරුන් සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන තුලින් කෘෂිකර්ම ව්‍යාප්ති අංශයේ සහකාර අධ්‍යක්ෂවරු මාර්ගයෙන් නිකුත් කිරීම සඳහා දිස්ත්‍රික් ගබඩාවල ගබඩා කරනු ලබයි.

ගොවිපල් හා රෝපණ ද්‍රව්‍ය අංශයේ බීජ පිරිසැකසුම් ඒකකවල ධාරිතාවය මත පිහිටා සහතික කළ බීජ සැපයුම කල්තියා සැකසුම් කෙරේ. මෙම ප්‍රමාණය දළ වශයෙන් රටේ සම්පූර්ණ අවශ්‍ය බිත්තර වී ප්‍රමාණයෙන් 10% කි.

(ඇ) ගොවිජන සේවා මධ්‍යස්ථානවල හා ග්‍රාමීය මට්ටමින් බීජ අලෙවි කිරීමේ කාර්‍ය්‍ය සතු දෙපාර්තමේන්තු ව්‍යාප්ති අංශය මගින් ව්‍යාප්ත ක්‍රම ආදර්ශණ, අධ්‍යාපන හා පුහුණු කිරීම් තුලින් ගොවීන් ලවා ප්‍රතිග්‍රහණය කිරීම පිණිස බීජ ව්‍යාප්ති කිරීම.

(ඇ) මෑතක දී වාණිජමය බිත්තර වී නිෂ්පාදනය සඳහා ග්‍රාමීය මට්ටමෙන් ද්විතියක බිත්තර වී ගොවිපලවල් ඇති කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීමෙන් තවත් ඉදිරි පියවරක් ගෙන ඇත. (විස්තර සඳහා 4 වන ඡේදය බලන්න) ගොවීන් අතර, සම්ප්‍රදායික බිත්තර වී හුවමාරු කර ගැනීම් උපයෝගිකර ගැනීමත්, අඩු ආදායම් සහිත ගොවීන්ට හොඳ තත්ත්වයේ බිත්තර වී ලබාදීමේ පහසු මාර්ගය සලසා දීම සහතික වීමත්, ප්‍රදේශය පුරාම එකම වර්ගයක පිරිසිදු බෝග වර්ගයක් ව්‍යාප්ති වෙන බවට සහතික වීමත්, මෙම යෝජනා ක්‍රමයේ මූලික දර්ශණය වේ.

2. (ක්‍රමවත්ව දක්වීම) රටට අවශ්‍ය බිත්තර වී ප්‍රතිපත්තියක් සකස් කර එතුලින් බිත්තර වී වැඩපිළිවෙල සැළසුම් කර මෙහෙයවීමටත්, බිත්තර වී වල තත්ත්වය (සහතික කිරීම) ට, අදාළ කටයුතු පිරික්සීම හා පාලනය කිරීමටත් පෞද්ගලික බිත්තර වී නිෂ්පාදනය කර්මාන්තයක් ඇති කිරීම දිරිමත් කිරීමටත්, බිත්තර වී මිළ කිරීම සඳහා අලෙවිය පිළිබඳ උපදෙස් දීමටත්, නව ප්‍රභේද මුදාහැරීම, ආදියටත්, ප්‍රභේදයන් මුදාහැරීම, බීජ ප්‍රමිති කරනයත්, බීජ අපනයනයත් ආදී උප කමිටු වලින් සමන්විත ජාතික බීජ කමිටුවක් පත්කර ඇත. කෘෂි සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත් (සියලුම අංශවල) ගොවිජන සේවා

දෙපාර්තමේන්තුවේත් කෘෂිකර්ම විද්‍යා පීඨයේත්, කෘෂි සංවර්ධන අධිකාරියේත්—නියෝජනත්වයෙන් සමන්විත මෙම කමිටුව මසකට තුන්වරක් රැස්වෙනු ඇත. බිත්තර වී කර්මාන්තයට අදාළ පරමාර්ථ වලටත්, බීජ පාලනයට හා ව්‍යවස්ථා සම්පාදනයට මෙම කමිටුවේ අවධානය යොමුවෙනු ඇත. වත්මන් යෝජනා ක්‍රම යත් එය ලබා ඇති දියුනුවත් ජාතික බීජ කමිටුව මගින් සමාලෝචනය කෙරෙනු ඇත.

3. ගොවිපල හා රෝපන ද්‍රව්‍ය අංශයේ ඇති බීජ සහතික කිරීමේ සේවාව මගින් ක්ෂේත්‍ර පර්යේෂණ පද්ධතියක් මගිනුත්, සැම්පල් කිරීම, බීජ විශ්ලේෂණය, හා විවිධ පංති වල බීජ, ලේබන කිරීමෙන් හා සහතික කිරීමෙන් තත්ව පාලනය කරනු ලැබේ. පේරාදෙණියේ හා මහඉලුප්පල්ලමේ පිහිටා ඇති සියළුම උපකරණ සහිත බීජ පර්යේෂණාගාර වලින් එයට සහාය ලැබේ. සහතික කරන ලද බීජ වලින් අවසන්වන සියළුම බීජ ප්‍රභේද පර්යේෂණය කර සහතික කරනු ඇත.

4. **වාණිජ බිත්තර වී.**—1980/81 මහ කන්නයෙන් පටන් ගෙන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ද සහය ඇතිව බුසල් 200 හෝ සහතික කළ බීජ බුසල් 100 යල කන්නයටත් මහ කන්නයටත්, වන පරිදි යාය පදනම මත එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයක පිළිගත් ගොවීන් අතර, බෙදා දෙනු ඇත. ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ලියාපදිංචි කරනු ලබන බිත්තර වී ගොවීන් තෝරා ගැනීමේ වගකීම කෘෂිකර්ම ව්‍යාප්ති සේවක සතු වේ. ගොවීන් විසින් උපදවනු ලබන බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මිළදී නොගනු ඇත. මෙම ගොවීන් දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක්වන අතර, ඔවුන්ට අවැසි කාර්මික දැනුමද එම නිලධාරීන්ගෙන් ලැබෙනු ඇත. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අවශ්‍ය යෙදවුම් සපයා දෙනු ඇත. කෘෂිකර්ම උපදේශක වරුන් මාර්ගයෙන් වාණිජ බිත්තර වී නිපදවන ගොවීන්ගේ ලැයිස්තුවක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් විසින් වගා නිලධාරීන්ට සපයා දෙනු ඇත. වාණිජ බීජ පාර්ශවිකව බෙදීමේ වගකීම වගා නිලධාරීන් මත පැවරේ. ඒවා හුවමාරු පදනම හෝ ණය පදනම මත ලබා ගැනීමට ගොවීන් අතර ප්‍රචලිත කිරීම හා දිරිමත් කරවීම ඔවුන් සතු කාර්යය වේ. (නිදසුනක් ලෙස ආහාරයට ගනු ලබන වී බුසල් $1\frac{1}{2}$ට වාණිජ බිත්තර වී බුසලක් සැපයීමෙන්)

5. ද්විතීයක බීජ ගොවිපලවල් සඳහා සහතික කළ බිත්තර වී හා ලියාපදිංචි කළ බිත්තර වී සැපයීම සඳහා කල්වේලා ඇතිව දැනුම් දීම.

සහතික කළ බීජ සඳහා කරනු ලබන සියළුම ඇරයුම් දිස්ත්‍රික්කයේ අධ්‍යක්ෂ (කෘෂිකර්ම) වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් බීජ ලබා ගැනීම ගොවිපල හා රෝපණ ද්‍රව්‍ය අංශය අමතනු ඇත. එවැනි ඇණවුම් කන්න දෙකකට පෙරාතුව ගොවිපල හා රෝපණ ද්‍රව්‍ය අංශයට ලැබෙන්නට සැළැස්විය යුතු මුත්, ස්ථිර ඇණවුම් ලබා ගැනීමේ ලා සහකාර අධ්‍යක්ෂ වරුනට මුහුණ පාන්නට සිදුවන දුෂ්කරතා හේතුවෙන් දැනුම්දිය යුතු අවම කාලය අඩුතරමින් එක් කන්නයකට පෙරාතුව විය යුතුය. සහකාර අධ්‍යක්ෂ වරුන් විසින් ලැබෙන ඇණවුම් පදනම මත එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට අවශ්‍ය කෙරෙන ප්‍රභේද හා ප්‍රමාණයන් තීරණය කරනු ඇත.

ඔවුන් විසින් ඉහත 4වැනි ඡේදයේ දී ඇති උපදෙස් ප්‍රකාර ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරුන් සමඟ එක්ව වාණිජ බීජ නිෂ්පාදන වැඩපිළිවෙළද සැළසුම් කරනු ඇත.

6. කලට වේලාවට වගා කටයුතු කිරීම, වල් පැළෑටි මර්ධනය කිරීම, රෝග හා පළිබෝධ මර්ධනය, නිවැරදි වේලාවට උපරිම පොහොර යෙදීම ආදියෙන් තොරව උසස් වර්ගයේ බීජ වලින් පමණක් පලදාව වැඩිකර ගත නොහැක. එමනිසා සහලින් ස්වයංපෝෂිත බව ලබා කර ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත්, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවටත් සම්බන්ධ සියළුම නිලධාරීන්ගේ සහාය පතයි.